**නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව - 2022**
**--------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු

කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් පවරා ඇති නඩු කටයුතු 03 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරවු කර නොතිබුණි. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවල නඩු පිළිබඳ තොරතුරු හෙළිදරව් කරන බව | නඩු පිළිබඳ හෙළිදරව් කළ යුතුය. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කසළ බදුන් ගිණුමේ රු.175,000 ක බැර ශේෂයක් ගිණුම්වලින් අත්හැරී තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ආ) | බගවන්තලාව නව වෙළඳ සංකීර්ණයේ ඉහල මහලයේ කඩ 21 ක් ඉදිකර දීර්ඝ කාලීනව බදුදීම සඳහා ටෙන්ඩර් කැඳවා ටෙන්ඩර් මුදලින් සියයට 25 ක් වශයෙන් ටෙන්ඩර්කරුවන් 21 දෙනෙකුගෙන් රු.12,347,375 ක එක්වන් මුදලක් ලබාගෙන කඩකාමර ඉදිකිරීමට අදාළ කිසිදු කටයුත්තක් සමාලෝචිත වර්ෂය තුළ සිදු නොකර මෙම මුදල් පොදු තැන්පත්වල රඳවා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි අගයන් දැක්විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොලි හා දැන්වීම් පුවරු ගාස්තු රු.351,019 ක් හා නීතිඥ ගාස්තු, වැටුප් හා ගමන් වියදම් එකතුව රු.319,443 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ<br>---------------------<br>1988 මැයි 17 දිනැති අංක 1988/22 දරණ චක්‍රලේඛය | වරිපනම් බදු සඳහා දේපල තක්සේරුව වසර 05 කට වරක්වත් සිදුකළ යුතු වුවද, 2010 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදී ද වරිපනම් බදු අයකර තිබුණි. | දේපල තක්සේරු කිරීම සම්බන්ධව තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමුකර ඇති බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,773,456 ක් වූ අතර ඊට අනුරූපීවඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,612,569 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බගවන්තලාව නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර ඉදිකිරීම සඳහා ලංසුකරුවන් තෝරා ගෙන ගිවිසුම් ගත නොවී රු.12,347,375 ක අත්තිකාරම් මුදලක් ලබාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 16 දින සිට දෙසැම්බර් 31 දින දක්වා මෙම මුදල් ආයෝජනය කර රු.909,562 ක පොලි ආදායමක් උපයාගෙන තිබුණි. ඒ අනුව මෙම කාර්ය සඳහා ලබාගත් මුදලින් රු.13,256,937 ක මුදලක් සභාව සතුව අවම වශයෙන් පැවතිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ මුදල් තත්ත්වය රු. 11,114,745 ක් පමණක් විය. කඩ කාමර ඉදිකිරීමට අදාළව කිසිඳු කටයුත්තක් ආරම්භ කර නොතිබියදී කඩ කාමර ඉදි කිරීම සඳහා ලබාගත් මුදලින් රු.2,142,192 ක මුදලක් සභා කටයුතු වෙනුවෙන් වැයකර තිබුණි. | මේ සඳහා ලබා ගත් මුදලින් රු.10,000,000 ක් ස්ථිර තැන්පත් වශයෙන් තැන්පත් කර ඇති අතර ඉතිරි රු.2,142,192 ක මුදල ගරු සභාපතිතුමා ඇතුළු මුදල් කමිටුව අනුමත කරන ලද විවිධ ගෙවීම් සිදුකර ඇති බව | රැස් කරගත් මුදල් අරමුණුගත කාර්ය සඳහා යෙදවිය යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 5,320,000 | 3,102,133 | 3,237,884 | 289,800 | 3,490,000 | 3,394,218 | 3.309.425 | 425,551 |
| (ii) | කඩ කුලී | 11,543,000 | 8,445,360 | 8,458,807 | 2,046,856 | 11,846,052 | 7,352,658 | 7,352,658 | 2,060,303 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,961,000 | 1,997,048 | 1,997,048 | - | 2,587,000 | 2,019,556 | 2,045,096 | - |
| (iv) | වෙනත් ආදායම් | 69,036,460 | 10,014,386 | 8,449,170 | 8,241,136 | 71,281,780 | 6,372,674 | 28,738,339 | 6,675,920 |
| | | 89,860,460 | 23,558,927 | 22,142,909 | 10,577,792 | 89,204,832 | 19,139,106 | 41,445,518 | 9,161,774 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු<br>-------------------<br>සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට රු.305,776 ක හිඟ වරිපනම් ශේෂයක් පැවති අතර ඉන් වර්ෂය තුළ අයවී තිබුණේ සියයට 56 ක් පමණක් විය. එසේම හිඟ වරිපනම් ශේෂය තුළ රු.3,095ක වසර 10 වැඩි හිඟ හිටි පෞද්ගලික වරිපනම් පරිශ්‍ර 2ක් සහ රු.21,790 ක වසර 5 ත් 10 ත් අතර හිඟහිටි වරිපනම් පරිශ්‍ර 6 ක්ද ඇතුළත්ව පැවතුණි. වරිපනම් පරිශ්‍ර 35 ක් වසර 1 සිට 5 දක්වා කාලයක් හිඟ හිටවූ රු. 108,438 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. | කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් අදාළ කාර්යයන් ප්‍රමාද වී ඇති බව | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කුලී<br>----<br>සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට කඩ කාමර කුලී රු.1,976,546 ක් අයකරගෙන නොතිබුණි. | ඉදිරියේදී අය කර ගන්නා බව | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (ඇ) | උසාවි දඩ හා මුද්දර ගාස්තු<br>-------------------------------<br>පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 875,636 ක් හා මුද්දර ගාස්තු රු.7,365,500 ක් විය. | උසාවි දඩ 2023.05.19 වෙනි දින රු.523,488 ක් හා මුද්දර ගාස්තු රු.3,699,660 ක් ලැබී ඇති බව | හිඟ ආදායම් ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ 93 සිට 95 දක්වා වගන්ති වලට අනුව මල අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ගලි රථයක් සභාව සතුව නොතිබුණු අතර ප්‍රදේශයේ මල අපද්‍රව්‍ය ඉවත් කිරීමට වැඩ පිළිවෙලක් නොතිබුණි. | සභාවේ මූල්‍යමය තත්වය ඉතා පහළ මට්ටමක පවතින බැවින් ගලි රථයක් මිළදී ගැනීමට නොහැකි වී ඇති බව | පනතින් පැවරුණු වගකීම් ඉටුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය සභා පනතේ 27 වන වගන්තිය අනුව මාර්ග ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ඉටුකිරීමට බලාපොරොත්තු වන බව | පනතින් පැවරුණු වගකීම් ඉටුකළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභා පනතේ 108 වගන්තිය අනුව කටයුතු කර ප්‍රාදේශීය සභාව විසින් පිරිපහදු කර මීටර් සවිකර විධිමත් පරිදි පිරිසිදු පානීය ජලය සැපයීමට ක්‍රියා නොකර මාසික ස්ථාවර ගාස්තුවක් පමණක් අය කොට තිබුණි. | ඉදිරියේදී පිරිසිදු පානිය ජල සැපයීමට කටයුතු කරන බව | මහජන සේවාවන් නිසි ලෙස ඉටු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අඹගමුව ප්‍රාදේශීය සභාවෙන් නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව වෙත අනුයුක්ත කර ඇති නිළධාරීන්ගේ ණය වාරික රු.639,031 ක් අඹගමුව ප්‍රාදේශීය සභාවට යැවීමකින් තොරව වසර 01 සිට වසර 04 ක කාලයක් පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. | මේ පිළිබඳව ඉදිරි කටයුතු දැනටමත් කරගෙන යන බව | අයකරගත් ණය යැවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඔස්බෝන් ඉහළ කොටස පුස්තකාල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.2,435,864 කට 2022 මාර්තු 15 දින ගිවිසුම්ගතව එම කටයුතු ආරම්භ කර නොතිබියදී, 2022 මාර්තු 22 දින රු.487,000 ක අත්තිකාරම් නිදහස් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ව්‍යාපෘති වැඩ අවසන් කර නොතිබුණි. | මේ සඳහා ගිවිසුම් ගත සමිතිය දැනුවත් කර ඇති අතර ගෙවන ලද අත්තිකාරම් මුදලට අදාළ වැඩ කටයුතු සිදු කර වාර්තා කරන ලෙස දන්වා ඇති බව | ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කර අත්තිකාරම් පියවාගත යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂයේදී ඉදිකළ කොන්ක්‍රීට් මාර්ග 28 ක සාම්පල පරීක්ෂා කිරීම සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු අංශය වෙත ගෙවා තිබුණු අත්තිකාරම් මුදලින් තව දුරටත් රු.63,000 ක මුදලක් පියවා නොතිබුණි. | රු.211,000 මුදලින් රු.148,000 ක මුදලක් දැනට පියවා ඇති අතර රු.63,000 මුදලක් පියවීමට ඇති බව | පරීක්ෂණ වාර්තා ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර තිබුණු ගොඩනැගිලි 03 ක් භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව පෙර පාසලක, වෛද්‍ය මධ්‍යස්ථානයක හා මහජන පුස්තකාලයේ පවතින වත්කම් ඒකක 117 ක් හා කාබනික පොහොර තොග වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව | වත්කම් ගිණුම්ගත කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 වර්ෂයේදී බගවන්තලාව නව වෙළඳ සංකීර්ණයේ කඩකාමර සඳහා ලංසු ඉදිරිපත් කර රු.150,000 ක මුදලක් තැන්පත් කළ ලංසුකරුවන් තිදෙනකුට කඩ කාමර අහිමි වී තිබුණද, තැන්පත් මුදල් ආපසු ගෙවා නොතිබුණු අතර ඉන් එක් | අදාළ පාර්ශවය මුදල් කමිටුවෙන් කඩ කාමරයක් ඉදිකර දෙන ලෙස තීරණය කර ඇති බැවින් එය ක්‍රියාත්මක කර ඇති බව | ආපසු ගෙවිය හැකි ලංසු මුදල් ආපසු ගෙවිය යුතුය. |

ලංසුකරුවෙකුට ටෙන්ඩර් පටිපාටියකින් තොරව බගවන්තලාව පිහිටි කඩ කාමරයක් රු.1,555,000 ක මුදලකට ලබාදී තිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බ්‍රිඩ්වෙල් මාර්ගය අසල ඇති සභාව සතු ඉඩමේ මායිම් නිරවුල් කරගෙන නොතිබුණු අතර එහි අනවසරයෙන් පදිංචිව සිටින පුද්ගලයින් සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. | අඹගමුව ප්‍රාදේශීය සභාව විසින් අප වෙත භාර දීමෙන් අනතුරුව ඉදිරියේදී සභාවේ පෙර පාසැලක් පවත්වාගෙන යාමට අදහස් කර ඇති බව | අනවසර පදිංචිකරුවන් ඉවත් කළ යුතුය. |
| (ආ) | සභාව සතු ඉඩම් 24 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණු අතර ඉඩම් 22 ක් සඳහා බලපත්‍ර හෝ ගිවිසුම් කිසිවක් විගණනයට ඉදිරිපත් නොවුණි. එම ඉඩම් 11 ක ආරක්ෂාව තහවුරු කර නොතිබුණි. | සභාවේ මූල්‍ය තත්ත්වය අනුව මිනුම් කටයුතු සිදුකර ඉඩම් ආරක්ෂා කර ගැනීමට කටයුතු කරන බව | සභා දේපල ආරක්ෂාව තහවුරු කළ යුතුය. |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කණුවේ උස පමණක් ප්‍රසම්පාදන ලියවිල්ලට ඇතුළත් කර ඇස්තමේන්තුගත ප්‍රමිතියට අනුකූල නොවූ කොන්ක්‍රිට් කණු 152 ක් ලබාගෙන රු.376,200 ක ගෙවීම් කර තිබුණි. | ප්‍රමිතියට අනුකූල කණු වෙළඳපලේ නොමැතිවීම නිසාත්,කොන්ත්‍රාත්තුව කඩිනමින් ඉටුකළ යුතු නිසාත්,එසේ කළ බව | ඇස්තමේන්තුගත ප්‍රමිතීන්ට අනුව වැඩ ඉටු කරවා ගත යුතුය. |

**3. 6 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැළැස්මක් පිළියෙල කර නොතිබුණි. | මානව සම්පත් සැලසුම පිළිබඳව පූර්ණ අවබෝධයක් නොමැති වීම හේතුවෙන් මේ දක්වා සැලැස්ම සකස් කර නොමැති බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | තනතුරු 94 ක් අනුමත වී තිබුණද, තනතුරු 22 ක පුරප්පාඩු 73 ක් පැවති අතර මේ හේතුවෙන් ආදායම් රැස්කිරීම, ප්‍රජා සේවාවන් මහජන සෞඛ්‍ය, කසල කළමණාකරණය ආදී සභාවේ මූලික කාර්යයන් ඉටු කිරීමේදී බාධාවක්ව පැවතුණි. | දැනට රටේ පවතින ආර්ථික අර්බුධය හේතුවෙන් නව බඳවා ගැනීම් තාවකාලික අත්හිටුවා ඇති බැවින් කාර්යාලයේ දෛනික රාජකාරි ඉටුකිරීමේ බාධාවක් ඇති වී ඇති බව | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ නව ස්වයං උත්පාදන සියයට 01 කින් වර්ධනය කර ගැනීමට අපේක්ෂා කර පසුව එහි ප්‍රගතිය සියයට 01 සිට සියයට 74 අතර පවතින බව කාර්ය සාධන වාර්තාවේ දක්වා තිබුණද, නව ස්වයං උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාව සම්මත කර නොමැති බැවින් ක්‍රියාත්මක කල නොහැකි වී ඇති බව | සැලසුම් ප්‍රකාරව කටයුතු ඉටුකළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 06 ක සියයට 26 සිට සියයට 90 දක්වාද වියදම් විෂයයන් 09 ක සියයට 0 සිට සියයට 122 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලනකාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | 2023 වර්ෂයේදී ඇස්තමේන්තු ප්‍රකාරව හැකිතාක් කටයුතු කරන බව | අවශ්‍යතාවය සලකා බලා අවධානම් අයවැය පිළියෙල කළ යුතුය. |

### 4.3 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කසල කළමනාකරණය සඳහා කිලානි ප්‍රදේශයේ පර්චස් 35 ක වපසරියකින් යුතු භූමි ප්‍රදේශයක් යොදා ගෙන තිබුණු අතර කසල කළමනාකරණයකින් තොරව බිම් පිරවුම් සඳහා යොදා ගෙන තිබුණි. වසර තුළ කාබනික පොහොර කිලෝග්‍රෑම් 700 ක් නිෂ්පාදනය කර තිබුණද, අලෙවිය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නෝර්වුඩ් ප්‍රාදේශිය සභාව නවක සංස්ථාපනය වූ සභාවක් හා මුල්‍ය මට්ටමින් ඉතා පහළ මට්ටමක පවතින සභාවක් බැවින් උපකරණ මිලදී ගෙන නොමැති බව | ඝන අපද්‍රව්‍ය නිසි පරිදි කළමනාකරණය කළ යුතුය. |

### 4.4 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ තිරසර සංවර්ධන අරමුණු 06 ක් ඔස්සේ ඉලක්ක 22 ක් පිහිටුවාගෙන තිබුණි. සභා බල ප්‍රදේශයේ කානු සියල්ල සියයට සියයක් ඉදිකිරීම මදුරුවන් බෝ වන සියලු ස්ථාන විනාශ කිරීම, පානීය ජල සාම්පල අඛණ්ඩව පරීක්ෂා කිරීම, ජල මුලාශ්‍ර ආරක්ෂා කිරීම, ඇති හැකි සෑමවිටම සූර්ය බල ශක්තිය සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රභව යොදා ගැනීම යන ඉලක්ක වසර තුළ සපුරාගෙන නොතිබුණි. එසේම අතුරු ව්‍යවස්ථා පැනවීම, අතුරු ව්‍යවස්ථා සංශෝධනය, නව අතුරු ව්‍යවස්ථා පැනවීම,තක්සේරු කිරීම යන ඉලක්කද වසර තුළ සපුරා ගෙන නොතිබුණි. | 2022 වර්ෂයේ සංවර්ධන කටයුතු සිදුකර නොමැත.කාණු ඉදිකිරීම් කටයුතු සිදුකර නොමැත. අනෙකුත් තිරසාර සංවර්ධන ඉලක්ක 2023 වර්ෂයේ සිදුකිරීමට අවශ්‍ය පියවර ගන්නා බව | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |